සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

7 ශ්‍රේණිය | කතෝලික ධර්මය | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

I කොටස

- 1 - 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ප්‍රධාන දිවැසිවරුන් වන්නේ,
    (i) යෙසායා, ජෙරමියා, හොසියා (ii) ආමොස්, ජෝනා, එසකියෙල්
    (iii) යෙසායා, ජෙරමියා, එසකියෙල් (iv) හොසියා, මීකා, ජෙරමියා

02. දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමඟ ඇති කරගත් ගිවිසුමේ බාහිර සලකුණ වන්නේ,
    (i) චර්මඡේදනයයි. (ii) දේදුන්නයි.
    (iii) දස පනතයි. (iv) කුරුසියයි.

03. ජේසුස් වහන්සේට ප්‍රථම ශ්‍රාවකයින් හමු වූයේ,
    (i) බෙත්ලෙහෙමේ දී ය. (ii) ජෙරුසලමේ දී ය.
    (iii) සීනයි කඳු මුදුනේ දී ය. (iv) ගලීල මුහුදු වෙරළ අසල දී ය.

04. ජේසුස් වහන්සේ කැඳවනු ලැබූ, රේගු පොළේ හුන් පුද්ගලයා වන්නේ.
    (i) පේදුරු තුමා ය. (ii) මතෙව් තුමා ය.
    (iii) පාවුළු තුමා ය. (iv) ජාකොබ් තුමා ය.

05. ජේසුස් වහන්සේව පාවා දුන් ජුදාස් වෙනුවට තෝරා ගනු ලැබුවේ,
    (i) මතියස් තුමා ය. (ii) ලූක් තුමා ය.
    (iii) තෝමස් තුමා ය. (iv) ඇන්ඩෘ තුමා ය.

06. ජීවිතයේ එක්වරක් පමණක් ලබා ගත හැකි දේව ප්‍රසාද නිධානයක් වන්නේ,
    (i) සමගි සන්ධානය (ii) දිව්‍ය සත්ප්‍රසාදය
    (iii) රෝගීන්ගේ ආලේපය (iv) පූජකවරය

07. දෙමව්පියන්ට හා වැඩිහිටියන්ට සැලකීමට අපට උගන්වන්නේ,
    (i) තුන්වන පනත ය. (ii) පස්වන පනත ය.
    (iii) සතරවන පනත ය. (iv) දෙවන පනත ය.

08. බොරු සාක්ෂි කීමට අප යොමු කරන්නේ,

(i) සිත ය. (ii) නපුරේ බලවේගය ය.

(iii) යහළුවන් ය. (iv) ආශාවන් ය.

09. සියළු වස්තුවල හිමිකරුවාණන් වන්නේ,

(i) මිනිසා ය. (ii) සත්ත්වයින් ය.

(iii) ඉර හඳ ය. (iv) දෙවියන් වහන්සේ ය.

10. පාපය සඳහා මිනිසා යොමු කරන මුල් ම සිතුවිල්ල වන්නේ,

(i) තණ්හාවයි. (ii) උඩගුවයි.

(iii) ධෛර්යයි. (iv) ප්‍රඥාවයි.

- **11 - 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

11. ජේසුස් වහන්සේ දොළොස් දෙනෙකු තෝරා ඔවුනට ............................................................................ යැයි නම් තැබූ සේක.

12. ප්‍රසාද ස්නාපනය ලැබූ දරුවා ............................................................................................ ආලේප කරනු ලබයි.

13. පූජකවරය දානය කරනු ලබන්නේ ............................................................................................................ විසිනි.

14. ............................................................................................................... ජනතා සේවයේ දේව ප්‍රසාද නිධානයකි.

15. ............................................................................................................................................ මුල් අගුණ පාපයකි.

( ආශිර්වාදකාර බන්ධනය / අපෝස්තුලුවරු / ඊර්ෂ්‍යාව / රාජගුරුප්‍රසාදීන් වහන්සේ / ක්‍රිස්මා තෙලයෙන්)

- **16 - 20 තෙක් ප්‍රශ්නවලට දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

16. පදවි පූජක පොරොන්දු ගණන දෙකකි. ( )
17. දෙවියන් වහයන්සේ විවාහ වන යුවලට ආශිර්වාද කරන සේක. ( )
18. මව්පියන්ට සැලකීම සතරවන දේව පනතට විරුද්ධ ක්‍රියාවකි. ( )
19. බොරු කීම බරපතල පාපයකි. ( )
20. අන් අය සතු දේපළ අයුතු ලෙස තබා ගැනීම වරදක් නොවේ. ( )

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) ඊශ්‍රායෙල් දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(2) ආබ්‍රහම් තුමාගේ කැඳවීමේ අංග දෙක නම් කරන්න.

(3) ජාකොබ් තුමාගේ දෙමව්පියන් නම් කරන්න.

(4) පූජා ප්‍රසාදිවරු බෙදෙන කොටස් දෙක නම් කරන්න.

(5) පැවිදි පූජක නිකායන් දෙකක් නම් කරන්න.

(6) කිතුනු විවාහයේ ලක්ෂණ දෙක නම් කරන්න.

(7) ශුද්ධ වූ සභාවට බොරු කියූ නිසා හදිසි මරණයට ගොදුරු වූ පුද්ගලයන් දෙදෙනා කවුරුන්ද?

(8) සත්වන පනතින් තහනම් වන දේවල් දෙකක් ලියන්න.

(9) සොරකම සිදුවන ආකාර දෙකක් ලියන්න.

(10) ගිහි කැඳවීම තුළ ඔබට පැවරෙන වගකීම් දෙකක් ලියන්න. (ලකුණු 2 x 10 = 20)

02. (1) ප්‍රථම ශ්‍රාවකයන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

(2) ජේසුස් වහන්සේ මෙලොවින් සමුගැනීමට පෙර තම ශ්‍රාවකයන්ට දුන් නියෝග තුන ලියන්න. (ල. 03)

(3) ක්‍රිස්තුන් වහන්සේ ලොවට හඳුන්වා දීමට කළ හැකි දේවල් පහක් ලියන්න. (ල. 05)

03. (1) ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී භාවිත කරන සංකේත දෙකක් ලියන්න. (ල. 02)

(2) පූජකවරයෙහි ධූරයන් තුන ලියන්න. (ල. 03)

(3) පූජාප්‍රසාදිතුමන්ලාගේ වගකීම් පහක් ලියන්න. (ල. 05)

04. (1) පදවි පූජකවරුන්ගේ පොරොන්දු දෙක ලියන්න. (ල. 02)

(2) පැවිදි පූජකවරුන් ගන්නා වේදභාර තුන නම් කරන්න. (ල. 03)

(3) පැවදි නිකායන්ගෙන් සිදුවන සේවාවන් පහක් ලියන්න. (ල. 05)

05. (1) පොදු පූජකවරයෙන් පැවරෙන වගකීම් ඉටු කිරීමට සහාය වන සමිති සමාගම් දෙකක් නම් කරන්න. (ල. 02)

(2) දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටු විය යුතු යුතුකම් තුනක් ලියන්න. (ල. 03)

(3) දෙමව්පියන්ගෙන් දරුවන්ට ඉටු විය යුතු යුතුකම් පහක් ලියන්න. (ල. 05)

06. (1) සත්වන හා දසවන පනත් දෙක නම් කරන්න. (ල. 02)

(2) සාධාරණව වස්තුව ලබාගත හැකි මාර්ග තුනක් ලියන්න. (ල. 03)

(3) සත්‍යගරුක සමාජයක් ගොඩනැගීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. (ල. 05)

07. (1) දිවැසිවරයා හඳුන්වන හෙබ්‍රව් වචනය සහ ග්‍රීක වචනය ලියන්න. (ල. 02)

(2) දේශක දිවැසිරු තිදෙනෙක් නම් කරන්න. (ල. 03)

(3) දිවැසිවර කැඳවීම තුළ ඔබට පැවරෙන වගකීම් පහක් ලියන්න. (ල. 05)

| 07 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය 2025 | කතෝලික ධර්මය |
|---|---|---|

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (iii) 02. ( i ) 03. (iv) 04. (ii) 05. ( i ) 06. (iv) 07. (iii) 08. (ii ) 09. (iv) 10. ( i )

11. අපෝස්තුලුවරු 12. ක්‍රිස්මා තෛලයෙන් 13. රාජගුරුප්‍රසාදින් වහන්සේ 14. ආශිර්වාදකාර බන්ධනය

15 ඊර්ෂ්‍යාව 16. (✓) 17. (✓) 18. (x) 19. (✓) 20. (x) (ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (1) දේශක / ලේඛක

(2) පරිත්‍යාග / අභියෝග

(3) ඊසාක් / රෙබෙකා

(4) පදවි පූජක / පැවැදි පූජක

(5) නිර්මල මරිය නිකාය / ජේසු නිකාය / සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය / දිව්‍ය සත්ප්‍රසාදීය නිකාය / ෆ්‍රැන්සිස්කාන තුන්වන නිකාය / ක්ලැරේසියාන නිකාය

(6) ඒකත්වය / අඛණ්ඩභාවය

(7) අනනියස් හා සපිරා

(8) සොරකම් කිරීම / බලහත්කාරයෙන් ගැනීම / අසාධාරණයෙන් ගැනීම / අන්සතු දේපල විනාශ කිරීම.

(9) ප්‍රයෝග / වංචනික ක්‍රියා / අල්ලස් ගැනීම / සේවකයන්ට සාධාරණ වැටුපක් නොගෙවීම / භාණ්ඩවල ගුණාත්මකබව අඩු කිරීම.

(10) පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න. (13 පාඩම)

02. (1) පේදුරු / ඇන්ඩෘ / ජාකොබ් / ජොහාන්

(2) සකල ජාතීන් ශ්‍රාවකයන් කරන්න.
පියාණන්ගේද, පුත්‍රයාණන්ගේ ද, ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බෞතිස්ම ස්නාපනය කරන්න.
මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්නට ඔවුනට උගන්වන්න.

(3) (පිටු අංක 40) සිසුවා ලියා ඇති කරුණු සලකා ලකුණු ලබා දෙන්න.

03. (1) ජලය / පාස්කු ඉටිපන්දම / සුදු වස්ත්‍රය / ශුද්ධවූ තෛලය

(2) තේවාචාරී / පූජක / රාජගුරු

(3) ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න. (පිටු අංක 47)

04. (1) කීකරුකම / පූජක බඹසර

(2) කීකරුකම / ව්‍රත ශුද්ධිය / දිළිඳුකම

(3) පිටු අංක 52 - 53

05. (1) ධර්මදූත ළමා සමාජය / පූජා උදව් සමිතිය / ළමා ක්‍රියාකාරී වීරයෝ / ගීතිකා කණ්ඩායම

(2) පිටු අංක 62 - 63

(3) පිටු අංක 61 - 62

06. (1) සොරකම් නොකරව / අන් වස්තු ආශා නොකරව

(2) අවංකව වැඩ කිරීමෙන් / කැපවීමෙන් සහ වෙහෙස මහන්සියෙන් / මිළට ගැනීමෙන් / හුවමාරු කර ගැනිමෙන් / තෑගි වශයෙන් / උරුම වශයෙන්

(3) ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න.

07. (1) හෙබ්‍රෙව් - නබී
ග්‍රීක - ප්‍රොෆෙටෙස්

(2) නාතාන් දිවැසිවරයා
එළියා දිවැසිවරයා
එලීෂා දිවැසිවරයා

(3) ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න.